රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2002

මගේ අංකය : 1/104/ඍ.ස.
ඒකාබද්ධ සේවා අංශය
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ
සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2002.01.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**<u>භාෂා පරිවර්තක සේවයේ II පන්තිය අහෝසි කිරීම</u>**

භාෂා පරිවර්තක සේවයේ II පන්තිය 2001.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කිරීමට රජය විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව.

අ. භාෂා පරිවර්තක සේවයේ II වැනි පන්තියේ I වැනි ශ්‍රේණියේ නිලධාරීන්, එම සේවයේ අවුරුදු 15 ක් සම්පූර්ණ කරන දින හෝ 2001.07.01 යන දින දෙකින් කලින් එළඹෙන දින සිටද,

ආ. භාෂා පරිවර්තක සේවයේ II වැනි පන්තියේ II ශ්‍රේණියේ සිට II වැනි පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත්වූ නිලධාරීන්, එම විභාගය සමත්වූ දින හෝ 2001.07.01 යන දින දෙකින් කලින් එළඹෙන දින සිටද,

ඇ. II පන්තියේ II ශ්‍රේණියේ සිටින අනෙකුත් නිලධාරීන් 2001.07.01 දින සිටද,

භාෂා පරිවර්තක සේවයේ I පන්තියට, අන්තර්ග්‍රහනය කරනු ලැබේ. එසේ අන්තර්ග්‍රහණය කිරීමේදී, ඉහත "ඇ" හි සඳහන් නිලධාරීන් "අ" සහ "ආ" සඳහන් නිලධාරීන්ට වඩා කණිෂ්ඨ විය යුතුය.

03. ඉහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් එසේ අන්තර්ග්‍රහණය කරනු ලබන දින සිට අදාල වැටුප් පරිමාණයේ පිහිටුවනු ලබන අතර, ඔවුන්ට හිඟ වැටුප් ගෙවනු ලබන්නේ 2001.07.01 දින සිටය.

04. මෙලෙස භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියට අන්තර්ග්‍රහණය කරගනු ලැබීම සඳහා, භාෂා පරිවර්තක සේවයේ II/II සහ II/I පන්තිවල සිටින නිලධාරීන්ට මේ සමඟ අමුණා ඇති ආකෘතිය අනුව 2002.03.31 දිනට පෙර සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අයදුම්කරන ලෙස දැනුම් දිය යුතුය.

එස්. රනුග්ගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

**<u>භාෂා පරිවර්තක සේවයේ II/II පන්තියේ හා II/I පන්තියේ නිලධාරීන් I පන්තියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන අයදුම් පත්‍රය</u>**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :

02. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :

03. භාෂා පරිවර්තක සේවයට පත්වූ දිනය :

04. ඒකාබද්ධ භාෂා පරිවර්තක සේවයට අන්තර්ග්‍රහණය වූ දිනය :

05. දැනට සිටින ශ්‍රේණිය :

06. එම ශ්‍රේණියට පත්වූ දිනය :

07. භාෂා පරිවර්තක සේවයේ II/I පන්තියට පත්කර ඇත්තේ උසස් කිරීම් විභාගයේ ප්‍රතිඵල මත නම් එම විභාගය සමත් වූ දිනය :

ඉහත අංක 1 සිට 7 දක්වා මා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවරදි බව සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන

දිනය :

**<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>**

............................................ මහතා/මහත්මිය/මෙනවිය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවරදි බව සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතන ප්‍රධානියාගේ
අත්සන

දිනය : නිල මුද්‍රාව